# 2022 ජනවාරි මස 19 වන දින පැවති නව ආයෝජන, ආදායම් ප්‍රවර්ධන, ඉඩම් හා දේපල නිරවුල් කිරීම පිළිබඳ ස්ථාවර කමිටුව

**සහභාගිත්වය**

| | | | |
|---|---|---|---|
| 1. | නීතිඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සභාපති |
| 2. | නලින් සිරිවර්ධන මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 3. | ඩී.ජී.ප්‍රේමදාස මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 4. | කේ.ඒ.ඉන්ද්‍රාණී මැතිතුමිය | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 5. | කේ.ජී.එන්.සී.බණ්ඩාර මහතා | - | නාගරික ඉංජිනේරු |
| 6. | එන්.පී.කේ.රණසිංහ මිය | - | පරිපාලන නිලධාරි |
| 7. | ඩී.එන්.ප්‍රියන්ති මිය | - | නීති නිලධාරි |
| 8. | එම්.ජී.සී.සනත් මහතා | - | ප්‍රධාන ආදායම් පරීක්ෂක |
| 9. | ජේ.බී.මධුෂා ගයත්‍රී මෙනවිය | - | විෂය ලිපිකරු |

**නොපැමිණීම**

| | | | |
|---|---|---|---|
| 1. | නීතිඥ රංජිත් රාජකරුණා මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 2. | නීතිඥ නිර්මලී ප්‍රියදර්ශනී මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |

- පරිපාලන නිළධාරි විසින් නව ආයෝජන, ආදායම් ප්‍රවර්ධන, ඉඩම් හා දේපල නිරවුල් කිරීම පිළිබඳ ස්ථාවර කමිටුවේ 2022 වර්ෂය සඳහා නව සභාපති තෝරා ගැනිමට ජන්ද පත්‍රිකා මාර්ගයෙන් සභාපති තෝරා ගැනිම සිදු කරන ලදි. ජන්දය ගනන් කිරිමේදී පැමිණි සිටි සියළුම නාගරික මන්ත්‍රීවරුන්ගේ ජන්දයෙන් නව සභාපති ලෙස ගරු නාගරික මන්ත්‍රී නිතීඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා තේරි පත්විය. මෙම කමිටුවේ ඉදිරි වැඩ කටයුතු කර ගෙන යාම සඳහා නව සභාපති වන ගරු නාගරික මන්ත්‍රී නිතීඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා වෙත භාර දෙන ලදී.

- කමිටුවේ සභාපති ගරු නාගරික මන්ත්‍රී නිතීඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ජන්දය ලබාදුන් සියලුම නාගරික මන්ත්‍රීතුමන් /මන්ත්‍රීතුමියන්හට ස්තුතිය ප්‍රකාශ කරමින් පැමිණ සිටි සියලු දෙනා පිළිගැනිමෙන් අනතුරුව කමිටුවේ වැඩකටයුතු ආරම්භ කරන ලදී.

1. උතුරු මැද පළාත,පළාත් පාලන දෙපාර්තමේන්තුව,නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස් විසින් ලිපියක් යොමු කරමින් පහත සඳහන් මහජන පැමිණිලි සම්බන්ධව ක්‍රියාමාර්ග ගෙන ඇත්ද, එසේ නම් ගන්නා ලද ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තාවක් ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම.

   1. අනුරාධපුර පොදු වෙළඳපලේ පවතින වර්තමාන තත්ත්වය ලෙස,

      I. පාරිභෝගිකයෙකුට බිමට ජලය නොමැතිවිම.
      II. රථවාහන නැවැත්විමට පහසුකම් නොමැතිවීම.
      III. වෙළඳසැල් හිමියන් විසින් වෙළඳ භාණ්ඩ එළියට දමා තට්ටු ගසා තිබෙන බැවින් පාරිභෝගීකයන් දැඩි අසිරුතාවයකට මුහුණ පැමට සිදුවිම.
      IV. වසා දමා ඇති කඩ කාමර පදික වේදිකාවේ වෙළඳුන්ට හෝ ලබාදීම මගින් එහි මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට ඉවත්විමට හැකියාවක් ඇත.

පොදු වෙළඳසැල් සංකීර්ණය ඇතුලත් පැමිණිල්ලට අදාල වාර්තාවක් ලබා ගැනිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු/නාගරික ගණකාධිකාරි)

2. ජී.එම්.අනුරලතා,අංක:39,අරිප්පු පාර,පැරණි නගරය,අනුරාධපුර, නගර සභාවට අයත් තිසාවැව ප්‍රධාන පාරට මුහුණලා පිහිටි ඉඩමේ තාවකාලිකව කර ගෙන යන වෙළඳ ව්‍යාපාරය ඉවත් කර ගන්නා ලෙස නගර සභාව විසින් දැනුම්දී ඇති බැවින් එම ස්ථානයෙන් කඩකාමරයක් ලබා දීමට කටයුතු කරන ලෙස කර ඇති ඉල්ලීම.

මෙම ඉඩම වන්දනාකරුවන්ගේ නවාතැන්පලක් වශයෙන් සංවර්ධනය කිරිමට පසුගිය මස මහා සභාව තීරණය කර ඇත. එබැවින් එම ස්ථානයේ තාවකාලික වෙළඳ කුටි ඉදිකිරිමට ඉඩදිය නොහැකි බවට තීරණය විය. මෙම තීරණය පළාත් පාලන කොමසාරිස්වරයා වෙත දැනුවත් කිරිමට තීරණය විය. (වගකිම - නාගරික කොමසාරිස්)

3. එළදා බඳුදීම යටතේ ඇති මුත්තුන්ඩුවත්ත අක්කර 1 ¼ ක ඉඩම කිසිදු සංවර්ධනයක් සිදු නොවන බැවින් එහි රථගාලක් ලෙස සංවර්ධනය කිරිමට ගත් තීරණය නැවත කමිටුව වෙත යොමු කිරිම.
මෙම ඉඩමේ පාපැදි හා යතුරුපැදි රථ ගාලක් සහිත පරිසර හා විවේක උද්‍යානයක් පිහිටුවිමට නිර්දේශ විය. (වගකිම - නාගරික කොමසාරිස් / නාගරික ඉංජිනේරු)

4. අනුරාධපුර,3 වන පියවර,අංක:2527/ 6/11 දරණ ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශයන් සම්බන්ධයෙන් තීරණයන් ගැනිමට යොමු කිරිම.
මෙම ඉල්ලීම සැළසුම් කමිටුවට ඉදිරිපත් කිරිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

5. කොළඹ,ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,අංක:58,අග්‍රාමාත්‍ය කාර්යාලය,සහකාර ලේකම් නාලක ජයසිංහ මහතා විසින් ලිපියක් යොමු කරමින් අංක 383 – 1 දරණ ඉඩම සහ ගොඩනැගිල්ල රාජ්‍ය සේවා විශ්‍රාමිකයින්ගේ භාර අරමුදල වෙත පවරා දිමට සුදුසු කටයුතු කරන මෙන් කල ඇති ඉල්ලීම.

මෙම දේපල විශ්‍රාමික සමිතියකට ලබාදී ඇත. ඒ අතර තුර රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල මෙම ඉඩම ඉල්ලා සිටි. එබැවින් ගතයුතු ක්‍රියා මාර්ගය පිළිබඳව මෙම දෙපාර්ශය සමග සාකච්ජා කර නිර්දේශ ලබා ගැනිමට තීරණය විය. (වගකිම - නාගරික කොමසාරිස්)

6. ස්වභා උයන අසල මල් අලෙවි කුටිවල හිමිකරුවන් විසින් විටින් විට කලහාකාරි ලෙස හැසිරිම හේතුවෙන් ධර්මපාල මාවත ප්‍රධාන මාර්ගයේ උසාවිය අසල මහජනයා නිතර ගැවසෙන මෙම ස්ථාන නිතර මොහුන් විසින් අසභය වචන හුවමාරු කර ගනිමින් නිතර ගැටුම් ඇති කර ගනු ලබයි. එබැවින් මෙම ස්ථානයෙන් මල් අලෙවි කුටි ඉවත් කිරිම සුදුසු ක්‍රියාමාර්ගයක් හා උපදෙස් ලබා දෙන ලෙස මහා නගර සභා ආදායම් පරික්ෂක විසින් වාර්තාවක් ඉදිරිපත් කර ඇත.

මෙම වාර්තාවට අදාල මල් අලෙවි කුටි දැනට ඉවත් කර ඇත. එබැවින් දැනට ගැටළු පැන නොගනි.

7. අනුරාධපුර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අතිරේක දිසාපති / අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්), සන්ධ්‍යා එන්.ජී.අබේසේකර විසින් ලිපියක් යොමු කරමින් නගර සංවර්ධනය කිරිමේ ව්‍යාපෘතිය යටතේ අනුරාධපුර අනගාරික ධර්මපාල මාවත මාර්ගය දෙපස අලුත්වැඩියා කරමින් පවතින බවත්, එම මාර්ගයේ ස්වභා උයන ආසන්නයේ එක් පසෙක මල් පැල අලෙවිකරුවන් වෙනත් ස්ථානයක් වෙත යොමු කර ඇති අතර නැවතත් එම ව්‍යවසායකයින් අදාළ ස්ථානයේ ස්ථාපිත කිරිමේ දී ප්‍රධාන මාර්ගයට අවහිරයක් නොවන පරිදි රථවාහන ගාල් කිරිමට ඉඩ සලසා දෙන ලෙසට කල ඉල්ලීම.
මාර්ග සංවර්ධනය කරන හෙයින් මල් අලෙවිකුටි ඉවත් කර ඇත.
මාර්ගය සංවර්ධන කරන හෙයින් මල් අලෙවිසැල් ඉවත් කර ඇත. මාර්ග සංවර්ධනය කර අවසන්වීමෙන් පසු මෙම ඉල්ලීම සලකා බැලිමට තීරණය විය. (වගකිම - නාගරික කොමසාරිස්)

8. අවසන් ගම් පිඹුරෙහි 14B හි සිතියමේ අංක 674 දරණ ඉඩම් කොටස අනුරාධපුර මහා නගර සභාවට අයත් වන බැවින් කැ.සි.අංක 110140 කලාප අංක 01 හි 174,175 හා 177 දරණ ඉඩම් කට්ටිය සඳහා ඉඩම් හිමිකම් කොමසාරිස්වරයා වෙත යවන ලද ලිපියේ පිටපත අනුරාධපුර මහා නගර සභාව නමින් හිමිකම් ලබා ගැනිම සඳහා ඉල්ලිමක් කරන ලදි
මෙම ලිපියට අදාලව ප්‍රගතිය වාර්තා කරන ලෙසට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

9. කොට්ඨාශ අංක 05 සිංහ කණුව අසල වී මෝල පාර අංක 14 දරණ භූමිය සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරික්ෂාවක් සිදු කොට ප්‍රධාන ආදායම් පරික්ෂක විසින් ඉදිරිපත් කර ඇති විස්තර වාර්තාව තීරණයක් ගැනිම සඳහා ඉදිරිපත් කිරිම.

මෙම ඉඩමට අදාලව ඉදිරිපත් කර ඇති ලේඛනවල දැක්වෙන ඉඩම් පරිහරණය, ඉදිරිපත් කර ඇති ගිවිසුම 2004/08/25 දිනැති මිනුම් සැළසුම් 02 නිශ්චිත නොවන හෙයින් මෙම ලේඛන පිළිබඳවත්, පරිහරණය පිළිබඳවත් 1 සිට 21 දක්වා සියළු ඉඩම් කට්ටිවලට අදාලව සැළසුම් අනුමත කිරිම, ගිවිසුම් ගතවිම, බදු කුලි ආදි විස්තර සහිත වාර්තාවක් කැඳවිමට තීරණය විය. (වගකිම - නාගරික ගණකාධිකාරි / නාගරික ඉංජිනේරු)

10. කොට්ඨාශ අංක 05 සිංහ කණුව අසල වී මෝල පාර අංක 17 (19) දරණ භූමිය සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරික්ෂාවක් සිදු කර ප්‍රධාන ආදායම් පරික්ෂක විසින් ඉදිරිපත් කර ඇති විස්තර වාර්තාව තීරණයක් ලබා ගැනිමට ඉදිරිපත් කිරිම.

අංක 17 දරණ මෙම ඉඩම් කොටසට ආර්.කේ.ඩොටි නෝනා නමින් මහා නගර සභාව විසින් 2008/10/22 දින ගිවිසුම් ගතව ඇති අතර එම ගිවිසුමේ සියලු කොන්දේසි කඩ කර ඇත. වසර 14 නගර සභාවට ආදායම් අහිමිව ඇත. එබැවින් බල රහිතවූ එම ගිවිසුමට අදාල දේපල ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මගින් සුදුසු අයෙක් තෝරා සංවර්ධනය කිරිමට නිර්දේශ විය. (වගකිම - නාගරික ගණකාධිකාරි)

11. කොට්ඨාශ අංක 05 සිංහ කණුව අදාල වී මෝල පාර අංක 21 දරණ භූමිය සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරික්ෂාවක් සිදු කර ප්‍රධාන ආදායම් පරික්ෂක විසින් ඉදිරිපත් කර ඇති විස්තර වාර්තාව තීරණයක් ගැනිමට ඉදිරිපත් කිරිම.

මෙම ඉඩම් කොටසට වෛරමුත්තු තම්බීරාසා නමින් මහා නගර සභාව විසින් 2008/11/24 දින ගිවිසුම් ගතවි ඇති අතර එම ගිවිසුමේ සියළු කොන්දේසි කඩකර ඇත. වසර 14 ක් නගර සභාවට ආදායම් අහිමි කර ඇත. එබැවින් බලරහිතවූ මෙම ගිවිසුමට අදාල දේපල ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මගින් සුදුසු අයෙක් තෝරා සංවර්ධනය කිරිමට නිර්දේශ විය. (වගකිම - නාගරික ගණකාධිකාරි)

12. අනුරාධපුර,2 වන පියවර,අංක:522/3 බි,සුනිල් ශාන්ත බස්නායක මහතා විසින් ලිපියක් යොමු කරමින් සංචාරකයන් සඳහා කුම්බිච්චන්කුලම වැවේ මගී බෝට්ටු,හංස බෝට්ටු සහ water jet යෙදීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරිමට අවසර ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම.

නව ආදායම් මාර්ගයකට අදාල යෝජනාවක් බැවින් කාලෝචිත ඉල්ලීමකි. මෙම ඉල්ලීම ඉටුකිරිම සුදුසු බවට නිර්දේශ විය. අයදුම්කරුගේ ව්‍යාපෘති වාර්තාවක් කැඳවීමටත් එය පිළිබඳව නාගරික ගණකාධිකාරි නිර්දේශ ලබා ගැනිමටත් නිර්දේශ විය.

14. 1. යාපනය හංදිය අසල පිහිටි නගරසභා වෙළඳ කුටි පිළිබඳ තත්ත්ව වාර්තාවක් ලබා ගැනිම.

2. එම වෙළඳ කුටි හා යාබඳ නගර සභාව සතු ඉඩම් කොටස් සහිතව මැනුම් වාර්තාවක් ලබා ගැනිම.

3. යාබඳ ඉදිකර ඇති අනවසර ඉදිකිරිම් වාර්තාව ලබා ගැනිම.

4. එම වෙළඳසැල්වල තක්සේරු වාර්තා ලබා ගැනිම.

5. එම වෙළඳසැල්වල ගිවිසුම් කාලය බදු මුදල, ගිවිසුම්කරුගේ තොරතුරු සහ හිඟ කඩකුලි ආදී විස්තර වාර්තාව ලබා ගැනිම. (වගකිම - නාගරික ගණකාධිකාරි /නාගරික ඉංජිනේරු)

15. මහා නගර සභා ආඥා පනතේ 245,247 (2) හා 287 වගන්තිවලින් පැවරි ඇති බලතල ප්‍රකාරව වාහන බදු අයකිරිම සඳහා ඇති හැකියාව පිළිබඳව වාර්තාවක් කමිටුව වෙත ලබා ගැනිමට තීරණය විය. (වගකිම - නාගරික ගණකාධිකාරි)

16. ගරු නාගරික මන්ත්‍රී ඩී.ජී.පේමදාස මැතිතුමා විසින් මහා නගර සභාවේ ඉදිරි සංවර්ධන කටයුතු වලට අවශ්‍යවී ඇති ඉඩම් කොටසක් (අක්කර 50 ක හෝ රජයෙන් ලබා ගත හැකි ප්‍රමාණය) අනුරාධපුර මහා නගර සභාවට අයත් යාබඳ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් වෙන්කර ගැනිම සුදුසු බවට ඉල්ලීමක් කරන ලදි.

මෙම ඉල්ලීම මහා නගර සභාවේ ඉල්ලිමක් වශයෙන් කටයුතු කරමින් ගරු නගරාධිපතිතුමාගේ අත්සනින් ගරු ඉඩම් ඇමතිතුමා වෙත යොමු කිරිම සුදුසු බවට තවදුරටත් තිරණය විය. (වගකිම - නාගරික කොමසාරිස්)

17. වරිපනම් නාම සංශෝධන සඳහා අයදුම් කරන්නන් ඉදිරිපත් කරන විකුණුම් කර (පැවරුම්කර) හා තෑගි කර ඔප්පුවල පිටපත්වල එම දේපල ගනුදෙනුවේදී නිසිපරිදි මුද්දර ගාස්තු ගෙවන ලද්දේ ද යන්න තහවුරු කර ගැනිම සඳහා එහි පිටපතක් මුද්දර ගාස්තු පරික්ෂා කිරිමේ විෂයට යොමු කිරිම කල යුතු බව තීරණය විය. (වගකිම - නාගරික ගණකාධිකාරි)

18. අනුරාධපුර මහා නගර සභා බලප්‍රදේශයට අදාල පැවරුම් කර (විකුණුම් කර) හා තැගි කර ඔප්පුවල සඳහාන් කර ඇති ප්‍රතිශ්ඨාව (තක්සේරු වටිනාකම) පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් යලි තක්සේරු කිරිම මත අතිරේක මුද්දර ගාස්තු (දණ්ඩනය හැර) මහා නගර සභාවට අය නොවන බව පෙනේ. එබැවින් එම අතිරේක මුද්දර ගාස්තුව පළාත් භාණ්ඩාගාරයෙන් ලබා ගත යුතු බව තීරණය විය. මේ යටතේ පෙර වර්ෂයේදි අය කල අතිරේක මුද්දර ගාස්තු ද ගනනය කර ලබා ගත යුතු බවටද තවදුරටත් තීරණය විය. (වගකිම - නාගරික ගණකාධිකාරි)

19. මහා නගර සභා ආඥා පනතේ 247 (ඉ) වගන්තිය යටතේ ඇතැම් ඉඩම් විකිණිම විෂයෙහි බදු නියම කිරිමට බලය ලැබි ඇත. මෙම වගන්තිය අනුව විකුණුම් මිලෙන් 1% ක බද්දක් අය කල හැකිය.

1. මෙම ඇතැම් ඉඩම් යන්න පැහැදිලි කර ගැනිමට තීරණය විය. අදාල නිර්දේශය නාගරික ගණකාධිකාරි හා නීති නිලධාරින්ගෙන් ලබා ගැනිමට තීරණය විය.

2. දැනටමත් මෙම බද්ද අයකිරිම කරනු ලැබුව ද එහි අදායම අයවැය ලේඛනවලින් පැහැදිලිව පෙන්නුම් නොකරයි. එබැවින් පසුගිය ආසන්න වසර 05 ක් තුල මෙම වගන්තිය යටතේ අය කර ආදායම් විස්තර ලබා ගැනිමට තීරණය විය.

(උදාහරණ වශයෙන් ප්‍රයිම්ලැන්ඩ් ආයතනය,නෙස්ක්‍රීයේෂන් ආයතනය,සීදේවි ආයතනය ඇතුලු විවිධ ආයතන විසින් නගරයේ විවිධ ස්ථානවල කට්ටි කර විකුණන ලද ඉඩම් විෂයෙහිලා බද්ද) (වගකිම - නාගරික ගණකාධිකාරි)

3. මෙම ඉඩම් කට්ටි කිරිමේදී පොදු කටයුතු සඳහා වෙන් කර ඉඩම්වල වාර්තාවක් ලබා ගැනිම. (වගකිම - නාගරික ඉංජිනේරු)

නීතිඥ ජේමසිරි හෙට්ටිආරච්චි,

නාගරික මන්ත්‍රී / කමිටු සභාපති,

නව ආයෝජන, ආදායම් ප්‍රවර්ධන,ඉඩම් හා දේපල නිරවුල් කිරිම පිළිබඳ ස්ථාවර කමිටුව,

මහා නගර සභාව,

අනුරාධපුර.